14 වන පිටුවෙන් (අදිසි)

වැහි සුළඟ දරා ගත නොහැකිව ඇළටම වැටී ඇත. තවත් විනාඩි කීපයක් ඇතුළත ඉතිරිව ඇති මුල් කීපයේ ශක්තිය ද බිඳ වැටී එයද දිය පහර සමගින් පහළට ගසාගෙන යනු ඇති බව නිසැක ය.

සුළං පහරත් සමගින් කාමරයට වැදෙන වැසි දිය වළකාලන්නට ජනේලය වසා දමන තිසල් සාලයට එයි. අම්මා ගෑස් ලිප දල්වන හඬ කුස්සිය දෙසින් ඇසෙයි.

"මං හිතුව තව පාඩං කරයි කියල ... කෝපි ටිකක් හදලා දෙන්ඩයි හැදුවෙ.." පොඩි නෝනා තිසල් දෙස නොබලාම කියයි. "..තව ටිකක් බලලා වැස්ස අඩු වෙන පාටක් නැත්නං පොත් ටිකත් අරං පන්සලට ගියොත් හොඳයි නේද පුතේ..? ගෙට වතුර දාන්ඩ තියා ගත්තොත් පාඩං කරලා හමාරයි"

තිසල් කතාවකින් තොරව අම්මා කෝපි කෝප්පයට සීනි දමා හැඳිගානායුර බලා සිටියි. මේ මහ වැස්සේ අම්මා පමණක් නිවසේ දමා යන්නට ඔහුගේ සිත ඉඩ නොදෙයි.

"අයිය නුවර ගියේ සුමානෙකට එන්නෑයි කියලා.." පොඩි නෝනා කෝපි කෝප්පය තිසල් අතට දෙමින් කියයි. "..පහුන දවස් දෙක තුනේම අහස පොළොව ගැවලන්නඩ වගේ කල්පනා කර කර හිටියා... මෙදා පාර නං පිලිවෙලකට ජීවිතේ හදාගන්ඩ හිතට අරං වගෙයි.."

කෝපි කෝප්පය තොල ගානා තිසල්ට අයෝමා සිහිපත් වෙයි. ඈ අයියා වෙතින් ඈත්ව ගොස් ඇති බව ඉවෙන් මෙන් ඔහුට දැනෙයි. අවසන් වරට ඔහු අයෝමා දැක්කේ සතියකට පමණ පෙරදීය. ඈ රණසිංහ ගේ වාහනයෙන් පන්සලට පැමිණ යන සැටි ඔහු බලා සිටියේ ආවාස ගෙයි ඔහුට සුපුරුදු කාමරයේ ජනේලයෙනි. කලකට පසු දුටු බැවින් දෝ ඇගේ පෙනුම අදහා ගත නොහැකි තරමට වෙනස් වී ඇතැයි ඔහුට ඒ වෙලාවේ සිතුණි. නවීන විලාසිතාවකට සැකසූ කෙස් කළඹත් වටිනා ඇඳුමත් කළකට පෙර ඈ වෙතින් දුටු අව්හිංසක බව උදුරාගෙන ඇත්තා සේ ය.

ඒ මොහොතේ ඈ හැසිරුණ අහංකාර පරවශ ස්වරූපය ඔහුගේ සිතේ අති කළේ අපුලකි. අයියා වැනි මහ පොළොවේ පය ගසා ගත් සාමාන්‍ය මිනිසකුට ඇගේ ඒ ස්වරූපය කොහෙත්ම නොගැලපෙන්නේ යයි තිසල්ට සිතුනි.

"සෙන් බුද්ධාගමේ කියමනක් තියෙනවා තිසල් හෙවණැල්ලට ලැබෙන්නෙත් මිනිහගෙ හැඩ රුවමයි කියල.." පොඩි හාමුදුරුවන් කියන්නේ කඩිසර ලෙස වාහනයට ගොඩ වන අයෝමා දෙස තිසල් ගේ උරහිසට උඩින් බලා සිටිමින් ය. ".. අපි කරන හැම දේකින්ම පිළිබිඹු වෙන්නෙ අපේ හැදියාවමයි තිසල්.."

"බිම වැටිච්ච මල් ආපහු අතු අගට යන්නෙ නැහැ කියලා කියමනකුත් සෙන් බුද්ධාග මේ තියෙනවා.." කාමරයෙන් පිටව යන අතරේ උන් වහන්සේ කියනු තිසල්ට හොඳින් ඇසුණි. උන් වහන්සේ අදහස් කළ දේ තිසල්ට හොඳින් වැටහෙයි. මේ සිදුවෙමින් පවතින කිසිවක් නැවත ආපසු හැරවිය නොහැකි ය.

අයියා මෙවර නුවර යන්නට පෙර තමා අත මුදල් නෝට්ටු කීපයක් තැබූ ආකාරය තිසල්ට සිහි වෙයි. අයියා කිසිවක් මුවින් නොකී නමුත් ඔහුගේ ගැඹුරු ඇස් බොහෝ දේ කීවේ ය. හැරී යන්නට පෙර උරහිස මත තැබූ ඔහුගේ අත වෙනදාටත් වඩා බරට තිසල්ට දැනුණි.

යමක් තේරුම් ගන්නට තරම් ශක්තියක් ලද දා සිට සිදුවූ සේ ම අදත් ඔහුගේ සිතේ අයියා පිළිබඳව කණගාටුවක් ජනිත වෙයි. "සුනන්ද සහෝදරයා කියන්නෙ තමං සිටිය යුතු තැන පිලිබඳ කිසිම අවබෝධයක් නැති මනුස්සයෙකුට... තමංගෙ පන්තිය ගැන හැඟීමක් තියේ නං ඔය වගේ රණසිංහ කාරයා ලඟට වෙලා ඉන්නෙ නැහැනෙ.." බණ්ඩාර අයියා වරක් කී සැටි තිසල්ට සිහිපත් වෙයි.

බණ්ඩාර කියන බොහෝ කරුණු කාරණා සේ ම ඒ කතාවේ අර්ථය ද තිසල්ට නොවැටහෙයි. ඔහුට වැටහෙන්නේ එක් දෙයක් පමණකි. ඒ අයියා මේ සියල්ල කරන්නේ මේ පවුල ජීවත් කරවන්නටය යන්නයි.

කෙසේ හෝ විභාගය සමත් විය යුතුය. විශ්ව විද්‍යාලයට යා යුතු ය. අයියා ගේ උත්සාහයට සාධාරණයක් කළ හැකි වන්නේ එවිට ය.

"තව ටිකක් බලල වැස්ස අඩු නූනොත් මං යන්නං.." තිසල් හිස් කෝප්පය අම්මා අතට දෙමින් කියයි.

00000000

වෙහෙසකර දවස නිමාවේ උනු වතුරින් නා ගත් පසු ගතට අපූරු සුවයක් දැනෙයි. එළිමහනට බැස මේ සුන්දර පරිසරය විඳගන්නට හදිසියේ ආ සිතුවිල්ල විසින් මෙහෙයවනු ලබන සුනන්ද කාමරයේ ඉදිරි දොරින් සඳලු තලයට ගොඩ වෙයි. මෙතැනට මහවැලිය අපූරුවට පෙනෙයි. සැඳෑ හිරු රැස් ගං දිය මත වැටී ඇත.

වත්ත පහළ සිට පඩිපෙළ නැග එන වින්ධ්‍යා බීරලු වැටට වාරු වී බලා සිටිනා සුනන්දට පෙනෙයි. පලා වට්ටියක්ද අතැතිව වින්ධ්‍යා පසු පසින් ආ සේවිකාව ඈ පසු කර පඩි පෙළ නැග මුලුතැන් ගෙය දෙසට යයි. ඉහළ සිට තමා දෙස බලා සිටිනා සුනන්ද දකින වින්ධ්‍යා නැවතෙයි.

"ඕනෙද..?" ඈ සිය අතේ ඇති පේර ගෙඩියක් පෙන්වා ඔහුගෙන් අසන්නේ අභිනයෙනි.

"ඔහොම ඉන්ඩ...මං තේ හදං එන්නං.." සුනන්ද ගෙන් ප්‍රතිචාරයක් නොලැබෙන තැන ඇය කියයි.

ගඟ දෙසින් හමා එන සුළඟේ නැළවෙන විලෝ ගස් පෙළ සිහින් හඬක් නගයි. ඒ හඬ පසුබිමේ තිබිය දී වත්ත පහළින් කොහෝ නාදයක් ඇසෙයි. මේ කොහෝ නාදය උදෑසනත් ඇසුණ බව සුනන්දට මතක ය.

මේ සිංහල අවුරුද්දටත් අම්මා සුපුරුදු ලෙසම ලිප ලඟ වරුවක් වාඩි වීගෙන කැවුම් පිසිනු ඇත. ඒ මල්ලීටත් තමාටත් කවන්නට ය. සුනන්දගේ දෑස් මත කඳුලු පටලයක් බැඳෙයි. සිය දරුදැඩු සිත මෙලෙස මෙලෙක් වී දියවී යන්නට පටන් ගත්තේ මෑතක සිට බව සුනන්ද දනියි. නිශ්චිත හේතුවක් සිතා ගත නොහැකි වුව ද මේ පරිවර්තනය මත වින්ධ්‍යා ගේ සෙවණැල්ල වැටී නැතැයි කාට නම් කිව හැකි ද?

කුසල් ගේ හෝටලය සාර්ථක ව්‍යාපාරයක් වනු ඇති බවට සැකයක් නැත. කුසල් එය හඳුන්වන්නේ අපේ හෝටලය කියා ය. අපේ යයි කියන විට තමාද දැන් අවිඥානිකව එහි හවුල්කරුවකු වී ඇති සැටි සුනන්දට දැනෙයි. ඔහුගේ සිතේ ඇති වන්නේ සතුටකි.

ඔහු වින්ධ්‍යා අතින් ඉඟුරු තේ කෝප්පය ගන්නේ ඒ සතුටින් දැල්වුණ දෑසින් ඈ දෙස බලමිනි.

"ජීවිතය ලස්සනයි වින්ධ්‍යා.." යි කියන්නට ඔහුට සිතෙයි. ඔහු නොකීවද එය ඇයට දැනෙන්නට ඇත. සීරුවෙන් ඉදිරියට එන වින්ධ්‍යා ඔහුගේ පුළුල් උරතලය මත සිය හිස තබා ගනියි. ඔහු සෙමින් පහත් වී ඇගේ හිස සිප ගනියි. සේපාලිකා මල් සුවඳ දැනුණේ ඇගේ කෙහෙ රළින් බවට සැකයක් නැත.

ළබන කළාපයට




12 වන පිටුවෙන් (පන්සිල්)

ජීවිතයේ පරම සැනසිල්ල ලබන්න නම් යමෙක් පංචශීල ප්‍රතිපදාව තුල සංවර්ධනය විය යුතුය. සැනසීමේ මාවත් සොයා ගෙන යන වර්තමාන ජනයා මිරිගුව පසුපස යන්නාක් මෙන් දුවා ඇවිදී. ඔවුන් තාවකාලික විනෝදාස්වාදය පතා සමාජ ශාලා, රාත්‍රී ශාලා, කැසිනෝ, ආදී විවිධ ස්ථානවල මතින් හමන වී සැනසීම සොයයි. එහෙත් එහි ඇත්තේ සදාකාලික සතුටක්ද එය තාවකාලිකව ලබන කායික සන්තර්පනයක ආශ්වාදයක් පමණක් විය හැකිය. එහි සැනසීමක් තිබේ යැයි යමෙක් තර්ක කරන්නේ නම් ඔහුට මුදල් තිබෙන කම් පමණි. එහෙත් යමෙකුගේ ජීවිතයටම තර්ජනය නොකර තවත් අයෙකුගේ දෙයක් සොරකම් නොකර අනුන්ගේ ස්ත්‍රීන් ලඟට නොගොස්, බොරුව,වංචාව,කේලම,හිස් වචන පිටු දක සුරාවෙන් සූදුවෙන්, තොර ජීවිතයක් කෙතරම් ආශ්වාද ජනකද කෙතරම් මිත්‍ර ශීලීද එබදු ජීවිතයක් ලද පිරිස් නිරන්තරයෙන් සතුට හා සහනය භුක්ති විදී. සහනය යම් තැනකද එතැන සතුට පිරී ඇත. සහනය නැතිකර ගෙන ඇත්තේ කවුරුන්ද?

සිතා බලන්න සහනය නැති කරගෙන ඇත්තේ තම තමා විසින්මය. අතෘප්තිකර ආශාවන් පසුපස හමා ගොස් සන් සිදීමක් සන්හිදියාවක් නොමැතිව වෙහෙසට පත් වී දුකින් වේදනාවෙන් කල් මරති. අප ලොවට එන විට රැගෙන ආවේ කුමක්ද? ලොවින් පිටවන දිනයට රැගෙන යන්නේ කුමක්ද? එහෙත් අප ජීවත් වන විට කෙතරම් දේ අප සතුව තිබේද? මේ කරුණු සම්බන්ධයෙන් ගැඹුරින් සිතා බැලීම තුලින් යථාර්ථයට ලඟා විය හැකි වන්නේය. යමෙකුට මේ කරුණු ඔස්සේ තර්ක විතර්ක ඉදිරිපත් කරන්නට හැකිය. කුමන තර්කයක් ඉදිරිපත් කළත් සැබෑ ස්වභාවය නම් එයයි. කුමන ආගමක ඉපදුනත් කුමන ජාතියකට අයත් වූවත් කුමන භාෂාවක් කථා කළත් ජීවිතය යනු තෘප්තිමත්ව තබා ගෙන යම් දවසක එයින් ඉවත් වී යා යුතු තාවකාලික නිවහනක් යන්නයි. එම නිවහන කරදර බාධක වලින් තොර සුන්දර අසපුවක් කරගන්නට නිවැසියන් විසින්ම උත්සාහ කළ යුතුය.

කාර්මික කරණයෙන් හෙම්බත් වෙමින් එයින් නිෂ්පදානය වෙන නවීන මෙවලම් ඔස්සේ ගමන් කරමින් වෙහෙසට පත්ව ජීවිතය නැමැති සුන්දර තැන අසුන්දර කර ගන්නා ජීවිත කොපමණද? මේ සියළු දේ ලැබුනත් තෘප්තියක් තිබේද? ඇතිවීම නොසන්සිදෙන අතර ජීවිතය කෙළවර වේ. එබැවින් ජීවිතාලෝකය පිණිස තම තමා විසින්ම අනුගමනය කළ යුතු වටිනා ගුණ දහම් පොෂණය කර ගත යුතුය. අන් අය කෙරෙහි ලැබෙන සැප සම්පත් ගැන වෛර නොකර සිතිය යුත්තේ තමාට ලැබෙන්නට තිබෙන දේ ලැබෙන බවත් එයින් බාහිරව නොලැබෙන බවත්ය. ලැබෙන්නට ඇති දේ කවුරුන් කෙසේ වැලකුවද එය ලැබෙන බව ඒකාන්තය. නොලැබෙන දේ කොතරම් පැතුවත් නොලැබෙන්නේය. එයට සසර හේතුකාරකයන්ද බලපානු ඇත. එබැවින් තමාගේ මෙළොව ජීවිතය සමෘද්ධි කර ගැනීමට නම් හැකි පමණ පංචශීල ප්‍රතිපාදාව තුළ ජීවත් වෙන්න උත්සාහ කිරීම වැදගත් බව පෙන්වා දිය හැකිය.

පාදක සටහන්.
*1.චරියාපිටක අටුවාව
*2. විසුද්ධි මාර්ගය, නිවන්දම ශ්‍රී ධර්ම කීර්ති හිමි
*3. අ.නි. මහානාම සූත්‍රය බුද්ධ ජ. ත්‍රීපිටක පොත්
*4. ශීලය, මාතෘදාස ලියනගේ මහතා
*5. දී. නි. සාමඤ්ඤඵල සූත්‍රය
*6. ලෝවැඩ සඟරාව කාව්‍ය සංග්‍රහය දෙ. වාචිස්සර හිමි.
*7. ලෝකෝපකාරය කාව්‍ය සංග්‍රහය
*8. සමාජ විද්‍යාව. කේ ඒ. කරුණාතිලක
*9. දිවයින දිනපතා පුවත් පත 2005.11.30
*10. ධම්මපදය මල වග්ගය